**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය**
General Certificte of Education (Adv. Level) Examination

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** ආදර්ශ ප්‍රශ්න පත්‍රය 1

I පත්‍රය *කාලය පැය 1 මි.30*

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) දුරස්ථ සන්නිවේදනය සඳහා ගත් පැරණිම උත්සහය වන්නේ,

i. ඊතලයේ පණිවිඩ බැඳ යැවීම
ii. මෝර්ස් සංඥා ක්‍රමය
iii. දුරකථනය යොදා ගැනීම
iv. පුහුණු කරගත් සතුන් යොදා ගැනීම
v. දූතයෙකු යොදා ගැනීම

02) චරිත නිරූපණයක් අපේක්ෂා නොකරන චිත්‍රපට ප්‍රභේදය වන්නේ,

i. කෙටි චිත්‍රපට ය
ii. වාර්තා චිත්‍රපට ය
iii. වෘත්තාන්ත චිත්‍රපට ය
iv. ප්‍රචාරක චිත්‍රපට ය
v. වාණිජ චිත්‍රපට ය

03) කම්මලේ ඉන්න බල්ලාට හෙණ ගැහුවත් ගාණක් නෑ යනුවෙන් ප්‍රකාශ කරන්නේ,

i. සන්නිවේදනයේ අර්ථ බාධක ඇතිවීම ය
ii. සන්නිවේදනයේ සංවේදීතාව සිඳී යාම ය
iii. සන්නිවේදනයේ මාධ්‍ය බාධක ඇතිවීම ය
iv. සන්නිවේදනයේ සුලබතාවයට හුරුවීම ය
v. සන්දේශයේ බලපෑම හීන වී යාම ය

04) 5W1H සංකල්පය තුළින් මග පෙන්වන්නේ,

i. රූපවාහිනී පිටපත් රචනයට ය
ii. විශේෂාංග ලිපි රචනයට ය
iii. කෙටිකතා රචනයට ය
iv. ප්‍රවෘත්ති රචනයට ය
v. නවකතා රචනයට ය

05) අන්තර්වර්තී සන්නිවේදන කටයුතු පහසු කර ගැනීම සඳහා වඩාත් පහසු සන්නිවේදන උපකරණය වන්නේ,

i. රූහැන් සහිත දුරකථනයයි
ii. ජංගම දුරකථනයයි
iii. වීඩියෝ කැමරාවයි
iv. පුවත්පතයි
v. ගුවන්විදුලියයි

06) කිසියම් පණිවිඩයක මතුවිය හැකි අර්ථ බාධක මගහැරවීම සඳහා වඩා අවධානය යොමු කළ යුත්තේ,

i. මාධ්‍ය තාක්ෂණික ක්‍රියාවලිය වෙතයි
ii. විකාශන ක්‍රියාවලිය වෙතයි
iii. සන්දේශ සම්පාදන කාර්යය වෙතයි
iv. මාධ්‍ය හා බැඳුණු පාරිසරික සාධක වෙතයි
v. නිවැරදි තෝරා ගැනීම පිළිබඳවයි

07) මහා මාර්ගයේ ගමන් කරන අවස්ථාවක මාර්ගයේ ඇඳ ඇති විවිධ රේඛා රටා අයත් වන්නේ,

i. නිර්වාචික සන්නිවේදනයටයි
ii. දෘෂ්‍ය සන්නිවේදනයටයි
iii. අවිධිමත් සන්නිවේදනයටයි
iv. වාචික සන්නිවේදනයටයි
v. මාර්ග සන්නිවේදනයටයි

නලිනිකා ලක්ෂානි

08) නූතන දෘෂ්‍ය මාධ්‍යයක් නොවන්නේ,

i. චිත්‍ර
ii. අත්පත්‍රිකා
iii. ධාරා සටහන්
iv. පෝස්ටර්
v. බිත්ති සටහන්

09) ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ පහත දැක්වෙන කරුණු අතරින් වඩාත්ම නිවැරදි ලක්ෂණයක් වන්නේ,

i. පූර්ණ කලාත්මක ස්වරූපයකින් යුක්ත වීම
ii. සමාජ පන්ති තෝරා බේරා ගනිමින් ආකර්ෂණය කරයි
iii. මහා පරිමාණ නිෂ්පාදනයක් හා බෙදාහැරීමක් පවතියි
iv. තාක්ෂණයට වඩා නිර්මාණශීලීත්වය අගයයි
v. කල්පවතින ස්වභාවයක් ඇත

10) ජනමාධ්‍යයේ නැගීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් අදාළ නොවන ප්‍රකාශය වන්නේ,

i. පුවත්පත් මත තොරතුරු ව්‍යාප්ත වීම වර්ධනය
ii. මුද්‍රණ කර්මාන්තයේ දියුණුව සමග සාහිත්‍ය සම්ප්‍රදායන් දියුණුවීම
iii. ගුවන්විදුලි FM නාලිකා ජාලය ශක්තිමත්වීම
iv. ජනමාධ්‍ය සමග සාම්ප්‍රදායික සංස්කෘතිය ආරක්ෂා වීම
v. රූපවාහිනිය සමග දෘශ්‍ය මාධ්‍ය පුළුල් වීම

11) ගෝලීයකරණයේ නව ප්‍රවණතා රාශියකි. පහත දැක්වෙන කරුණු පිළිබඳ විමසා බලා සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

i. භාණ්ඩ නිෂ්පාදනය හා ඒවායේ ප්‍රමාණාත්මක වර්ධනය
ii. නව මාධ්‍ය ලෙස ජංගම දුරකථන පෙරට ඒම
iii. අන්තර්ජාතික වෙළඳ ගණුදෙනු වර්ධනය
iv. සමස්ත ජීවන අවකාශය මාධ්‍යකරණය වීම
v. පාරදේශාන්තිකව තොරතුරු ව්‍යාප්ත වීම

12) සන්නිවේදන ආකෘති පිළිබඳ අධ්‍යයනය කිරීමේදී,

A. ග්‍රාහකයා B. තොරතුරු මූලාශ්‍රය C. අග්‍රස්ථානය D. සම්ප්‍රේෂණාගාරය

මෙම මූලිකාංග ඇතුළත් වන ආකෘතිය වන්නේ,

i. ලැස්වෙල්
ii. විල්බර් ශ්‍රාම්
iii. බර්ලෝ
iv. ෂැනොන් වීවර්
v. ඔස්ගුඩ්

13) වර්තමාන ජනමාධ්‍ය කෙරෙහි ජනතාව විවිධාකාරයෙන් විවේචනාත්මකව කරුණු දක්වයි. එම විවේචනාත්මක අදහස් අතරින් සාවද්‍ය වන්නේ,

i. ජනමාධ්‍ය මගින් ජනතාවගේ ජීවිතවල සබඳතා දුරස් කරයි
ii. ජනමාධ්‍ය මගින් සංස්කෘතික හුවමාරුවක් සිදු කරයි
iii. ජනමාධ්‍ය මගින් ජනතාවට තම ජීවිතවලට අදාළ ප්‍රධාන ප්‍රශ්න අමතක කරවයි
iv. ජනමාධ්‍ය මගින් ජාතිවාදී හා වාර්ගික කේන්ද්‍රීය හැඟීම් වර්ධනය කරවයි
v. ජනමාධ්‍ය මගින් යථාර්ථය පිළිබඳ ව්‍යාජ චිත්‍ර මවයි

නලිනිකා ලක්ෂානි

14) සිනමා මාධ්‍ය පිළිබඳ පහත දැක්වෙන කරුණු අතරින් සාවද්‍ය වන්නේ,

i. සිනමාව යනු රසායනික මාධ්‍යයකි
ii. සංදේශවල කාලය සීමාරහිත නිසා විවිධ වැඩසටහන් ආකෘතිවලින් යුක්තයි
iii. බාධාවන්ගෙන් තොරව නැරඹිය හැකිය
iv. පුළුල් තිර සහිත මාධ්‍යයකි
v. දැවැන්ත බවක් ඇත

15) තොරතුරු සම්පාදන කාර්යයේ වැදගත්කමක් නොවන්නේ,

i. විවිධ මත ගොඩනැගීම
ii. ජන විඥානය පුළුල් කිරීම
iii. කටකතා පැතිරවීම
iv. තොරතුරු අළෙවි කළ හැකි වීම
v. නිරන්තරයෙන් පරිසරය පිළිබඳ අවධියෙන් සිටීමට හැකිවීම

16) පාසල් නිමා වී ගෙදර එමින් සිටි රුවනි අතරමග දුටු ගැහැණුන් දෙදෙනෙකුගේ රණ්ඩු සරුවල්වීමේ සිද්ධිය පිළිබඳව තම මවට නිවසට ගොස් ප්‍රකාශ කළාය. මෙම සිද්ධිය මැනවින් ගම්‍යමාන වන නිර්වචනය වන්නේ,

i. ලැස්වෙල් නිර්වචනය
ii. ශ්‍රාම් නිර්වචනය
iii. ෂැපීර් නිර්වචනය
iv. බර්ලෝ නිර්වචනය
v. ෂැනොන්-වීවර් නිර්වචනය

17) බැංකුවක රාත්‍රී මුර සේවයේ යෙදී සිටි පියල්ට තදින්ම නින්ද ගියේය. නමුත් ආරක්ෂක සංඥා පද්ධති සවි කර ඇති හෙයින් බැංකුව වෙත කඩා වැදීමට සැරසුනු සොරුන් හට බැංකුව කැඩීමට නොහැකි වූයේ ආරක්ෂක සංඥා පද්ධතියේ නාදය නිසාය. පියල් ද එම නාදයෙන් අවදි විය. ඔහුට සොර මුල හඳුනාගත හැකි විය. මෙහි සන්නිවේදන විධි අනුපිළිවෙල වනුයේ,

i. ශ්‍රව්‍ය හා අවිධිමත්
ii. ශ්‍රව්‍ය හා දෘශ්‍ය
iii. ශ්‍රව්‍ය හා විධිමත්
iv. ශ්‍රව්‍ය හා අන්තර්වර්තී
v. නිර්වාචික හා වාචික

18) ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශයේදී යෙදෙන භාෂාවේ දුබලතාවයක් ලෙස දැකිය හැක්කේ,

i. සරල බවයි
ii. සංක්ෂිප්ත බවයි
iii. ව්‍යාංග්‍යාර්ථ බවයි
iv. පැහැදිලි බවයි
v. නිර්මාණාත්මක බවයි

19) එක්තරා පුවත්පතක සංස්කාරක ප්‍රතිපත්ති මෙසේ සඳහන් කොට තිබුණේය,

A- රාත්‍රී සමාජශාලා පිළිබඳ ප්‍රවෘත්ති ප්‍රතික්ෂේප කිරීම
B- සුරාසැල් පිළිබඳ දැන්වීම් ඇතුළත් නොකිරීම
C- ඇඩ්වටෝරියල් සඳහා ඉඩ නොදීම
D- මළ සිරුරුවල ඡායාරූප පළ නොකිරීම

ඉහත ප්‍රතිපත්ති හැඳින්වීමට වඩාත් යෝග්‍ය යෙදුම කුමක්ද?

i. ස්වයං නියාමනය
ii. වාරණය
iii. නීතිමය බාධක
iv. ප්‍රකාශන නිදහස
v. සදාචාරාත්මක බව

20) උපකරණ, පාරිභෝගික ද්‍රව්‍ය, මානව සංකල්පනා හා චාරිත්‍ර.... යන අංගයන් සංස්කෘතිය තුළින් අවධාරණයට යොමු කරන ලද්දේ,

i. රැල්ෆ් ලින්ටන් ය
ii. බී මැලිනොවුස්කි ය
iii. එඩ්වඩ් ටයිලර් ය
iv. ඩඩ්ලි සියර් ය
v. මාෂල් මැක්ලූහන් ය

21) ප්‍රමාද වූ ප්‍රතිපෝෂණය යන්න වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ,

i. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ය
ii. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ය
iii. ජන සන්නිවේදනයේ ය
iv. සමූහ සන්නිවේදනයේ ය
v. අවාචික සන්නිවේදනයේ ය

22) වර්තමාන ජනමාධ්‍ය සිය ග්‍රාහකයන් පොළඹවාලීම සඳහා යොදා ගන්නා උපක්‍රමයක් නොවන්නේ,

i. නව වැඩසටහන් ආකෘති හඳුන්වාදීම
ii. විදේශ සංචාර ලබා දීම
iii. දුරකථන සංවාදවලට සජීවීව සම්බන්ධ කර ගැනීම
iv. උනන්දුව ඇති කිරීම
v. ජනප්‍රිය චරිත යොදා ගැනීම

23) රූපණය පදනම් කරගත් ජනශ්‍රැතිකාංගයක් නොවන්නේ,

i. රට යකුම
ii. රූකඩ
iii. ජන සංගීතය
iv. ජන ගී
v. ජන ක්‍රීඩා

24) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

i. ප්‍රවෘත්තියක් ග්‍රාහකගත වීම දොරටුපාල කාර්යය මත රඳා පවතියි
ii. රූපණය පුද්ගලබද්ධ සංසිද්ධියක් ලෙස දැක්විය හැකිය
iii. නව සමාජ අවශ්‍යතා මාධ්‍ය සංස්කෘතිය මගින් නිරූපණය කරයි
iv. දෙපියවර ආකෘතියේ දී ජනමත නායකයන් සහ අනුගාමිකයන් සම්බන්ධ වේ
v. සමූහ සන්නිවේදනය ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් තීරණය වේ

25) ඵලදායී කථිකයා සතු ගුණාංගයක් නොවන්නේ,

i. විෂයීය අවබෝධය
ii. ආවේගශීලී නොවීම
iii. තර්කානුකූල බව
iv. සන්නිවේදකයා මුඛ්‍ය වීම
v. සංවිධානාත්මක බව

26) නාලන්ද ප්‍රදේශය ආසන්නයේ ජල නලයක් පුපුරා ඇත. මේ සඳහා කඩිනමින් දැනුම්දීමට භාවිත කළ හැකි අවම වැදගත්කමකින් යුතු ආකාරය වන්නේ,

i. විද්‍යුත් තැපැල් මගින්
ii. හදිසි දුරකථන අංකයට ඇමතුමක් ලබා දීම
iii. කෙටි පණිවිඩයක් ලබා දීමය
iv. ගාස්තු රහිත දුරකථන අංකයකට දැනුම්දීමය
v. තැපැල් මගින් දැනුම්දීමය

27) ළමා චිත්‍රපටයක මූලික ලක්ෂණය විය යුත්තේ,

i. උපරිම වින්දනයක් ලබා දීමයි
ii. ළමයින් රංගනයට යොදා ගැනීමයි
iii. ළමා මනස තේරුම් ගැනීමයි
iv. සරල කතා වස්තුවක් තිබීමයි
v. කාටූන් චරිත යොදා ගැනීමයි

- අංක 28 සිට 33 දක්වා පහත වගුව අනුසාරයෙන් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A- බාධක | B- ආකේතිකරය සන්නිවේදකයා | C- බලපෑම |
| D- විකේතිකරය ග්‍රාහකයා | E- සම්ප්‍රේශක ට්‍රාන්ස්මීටරය | F- පණිවිඩය |
| G- නාලිය | H- අර්ථකථන | I- ප්‍රතිපෝෂණය |
| J- මූලාශ්‍රය | K- අග්‍රස්ථානය | L- සංඥා |
| M- සන්දර්භය | N- ප්‍රතිචාර | O- අත්දැකීම් පසුතලය |

28) ඉහත අංග අතුරින් සම්ප්‍රේෂණාත්මක ආකෘතියට ඇතුළත් අංග වන්නේ,

i. B,F,L,G,M ය
ii. B,E,L,D,K ය
iii. J,E,L,D,K ය
iv. J,E,L,O,K ය
v. J,E,H,I,K ය

29) ඉහත අංග අතුරින් දේශපාලන දෘෂ්ටි කෝණයෙන් ඉදිරිපත් කරන ආකෘතියට අතුළත් අංග 4 ක් නොවනුයේ,

i. I,L,OK,N ය
ii. B,K,M,J,E ය
iii. B,F,G,D,C ය
iv. B,F,G,D,I ය
v. J,E,L,D,G,K ය

30) B හා D අතර අවබෝධයක්, සම්බන්ධතාවක් ගොඩ නැගීමට L අපොහොසත් වන්නේ නම්, එය හඳුන්වන්නේ,

i. A ලෙසය
ii. I ලෙසය
iii. G ලෙසය
iv. C ලෙසය
v. N ලෙසය

31) සන්නිවේදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සන්නිවේදකයාට මෙන්ම ග්‍රාහකයාට ද වැදගත් වන්නේ,

i. C හි හැකියාවයි
ii. H හි හැකියාවයි
iii. K හි හැකියාවයි
iv. N හි හැකියාවයි
v. E හි හැකියාවයි

32) විල්බර් ශ්‍රාම් ආකෘතිය හඳුනාගත හැකි වරණය කුමක්ද?

i. B,F,G,H ය
ii. B,F,D,I ය
iii. J,F,G,B ය
iv. B,F,D,H ය
v. B,D,F,E ය

33) ඉංග්‍රීසි ගීත පමණක් ශ්‍රවණය කරන ලද ඇන්ඩෘ හට සිංහල ජන ගීවල රසවින්දනය ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වූයේ,

i. A නිසාය
ii. H දුර්වල නිසාය
iii. O සමාන නොවන නිසාය
iv. I නොමැති නිසාය
v. D නිසාය

නලිනිකා ලක්ෂාණි

34) ප්‍රිය සම්භාෂණයකට අවශ්‍ය ඇඳුම් මිළදී ගැනීමට ගිය ව්‍යාපාරිකයකු වූ චන්ද්‍රික අධික දිගුකල් පවත්නා ඇඳුම් වෙනුවට කල් පැවැත්මෙන් අඩු ආකර්ෂණීය ඇඳුමක් මිළදී ගත්තේය. මෙම සමාජ ප්‍රවණතාව වන්නේ,

i. රූපවාහිනී වෙළඳ දැන්වීම්ය
ii. අධි පරිභෝජන රටාවන්ය
iii. ජනප්‍රිය සංස්කෘතිය ය
iv. මාධ්‍ය සංස්කෘතියය
v. නව මාධ්‍යයේ වේගවත් බවය

35) පෝස්ටර් මාධ්‍යයේ වැදගත්කමක් නොවන්නේ,

i. නිරායාසයෙන් අවධානයට ලක් නොවීම
ii. නිර්මාණශීලීව සකස් කර ගත හැකි වීම
iii. අභිමත පරිදි සකස් කර ගත හැකි වීම
iv. සාපේක්ෂ වශයෙන් පිරිවැය අඩුවීම
v. අවශ්‍ය භූගෝලීය සීමාව තුළ යොදා ගත හැකි වීම

නලිනිකා ලක්ෂානි

නලිනිකා ලක්ෂානි